# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No.
RG/MBD/01චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No.
565

ඔබේ අංකය
உமது இல.
Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය
திகதி
Date
2023.01.12


චක්‍රලේඛ අංකය : 01/2023

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මඟින්
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>ජාතිය දැක්වීමේ දී "ඉන්දීය දෙමළ/යෝනක" යන්න "ලාංකික දෙමළ/යෝනක" ලෙස භාවිත කිරීමට අදාළ ප්‍රතිපාදන</u>**

මෙම දෙපාර්තමේන්තුවට අදාළ රෙජිස්ටරවල සහ වාර්තාවල ජාතිය සඳහන් කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතෙහි IV කාණ්ඩයේ IX වැනි පරිච්ඡේදයේ 150 වන වගන්තිය මගින් දක්වනු ලබන ප්‍රතිපාදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

" පුරවැසි භාවය ලබා ගැනීම යමෙකුගේ වර්ගීය සංහතිය කෙරෙහි බලනොපාන බැවින් පුරවැසිභාවය පිළිබඳ තත්ත්වය සැළකිල්ලට නොගෙන ඉන්දියානු ජාතිකයන් වන දෙමළ සහ යෝනක මිනිසුන් "ඉන්දියානු දෙමළ" හෝ "ඉන්දියානු යෝනක" යනුවෙන් හැඳින්විය යුතු අතර පෙර පරම්පරා දෙකක් (පියා සහ මුත්තා) ලංකාවේ ඉපදී ඇත්තා වූ දෙමළ හා යෝනක පුද්ගලයින් "ලාංකික දෙමළ" හෝ "ලාංකික යෝනක" යනුවෙන් හැඳින්විය යුතු වේ.

02. ඒ අනුව මින් ඉදිරියට උක්ත සංශෝධනය මත පදනම්ව 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව උප්පැන්න ලේඛනයක ජාතිය සටහන් කිරීම හෝ සංශෝධනය කිරීම සිදු කළ යුතුය. මෙම ක්‍රියාවලිය උප්පැන්න ලේඛනයෙහි ජාතිය සටහන් කිරීමක් හෝ සංශෝධනයක් සම්බන්ධයෙන් අදාළ වන අතර, එම පාර්ශ්වයට අදාළ අනෙකුත් සියලු ලේඛනයන්හි ජාතිය උප්පැන්න ලේඛනය අනුව විය යුතු ය.

03. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියළුම කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු අතර කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව මා වෙත දන්වන්න.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. සියලුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා
3. සියලුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් හා සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා
4. ප්‍රධාන කාර්යාලයේ සියලුම විධායක හා මාණ්ඩලික නිලධාරීන් - කාරුණික දැන ගැනීම සඳහා




දුරකථන අංකය / தொலைபேசி இல. 2889488
ෆැක්ස් අංකය / தொலைநகல் 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் rgd@sltnet.lk